SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජූලි

## යෝජිත උත්තර

## (103) ආර්ථික විද්‍යාව (ECN)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669



මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර I විභාගය - 2024 ජුලි**

## (103) ආර්ථික විද්‍යාව

# යෝජිත උත්තර

(මුළු ලකුණු 40) **A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරः***

**1.1** (4)

**1.2** (2)

**1.3** (1)

**1.4** (3)

**1.5** (3)

**1.6** (1)

**1.7** (1)

**1.8** (1)

**1.9** (3)

**1.10** (4)

**1.11** සාර්ව

**1.12** ශුන්‍ය

**1.13** සත්‍ය

**1.14** අසත්‍ය

**1.15** ආකාර දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- බදු පැනවීම
- සහනාධාර ලබා දීම
- මිල සීමා හඳුන්වා දීම
  - උපරිම නෛතික මිල සීමා හඳුන්වා දීම
  - අවම නෛතික මිල සීමා හඳුන්වා දීම
- මිල ස්ථායිකරණය

**1.16** වෙනස්කම් දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| අවශ්‍යතා සියලුම දෙනාට පොදු වේ | වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ |
| අවශ්‍යතා සීමිත වේ | වුවමනා අසීමිත වේ |
| අවශ්‍යතා ප්‍රාථමික වේ | වුවමනා ද්විතීයික වේ |
| අවශ්‍යතා සපුරා ගැනීම අනිවාර්ය වේ | වුවමනා සපුරා ගැනීම අනිවාර්ය නොවේ |
| ප්‍රචාරණය මඟින් අවශ්‍යතාවන්ට බලපෑම් කල නොහැක | ප්‍රචාරණය මඟින් වුවමනාවන්ට බලපෑම් කල නොහැක |

**1.17** ණය ශ්‍රේණිගත කිරීම යනු මූල්‍ය උපකරණ ඒවායේ ගුණාත්මකභාවය මත පදනම්ව ශ්‍රේණිගත කිරීමයි. එමඟින් ණය ලබාගත් තැනැත්තෙකුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව තක්සේරු කිරීමක් සිදුකරයි. මේ සඳහා ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ණය ලබාගත් තැනැත්තාගේ නුබුන්වත්භාවය මත ණය ශ්‍රේණිගත කිරීමක් නිකුත් කරයි. විශාලතම ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන වන්නේ,

- ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් සමාගම - Standard and Poor's (S&P)
- මූඩීස් සමාගම - Moody's
- ෆිච් රේටින්ග්ස් සමාගම - Fitch Ratings

**1.18** කතිපයාධිකාරි වෙළඳපොළ ව්‍යුහයේ ලක්ෂණ දෙකක් බලාපොරොත්තු වේ.

- වෙළඳපොළ තුල ආයතන කිහිපයක් පමණක් ක්‍රියාත්මක වේ
- ප්‍රවේශය සහ පිටවුම බාධාකාරී වීම
- කර්මාන්තය තුල සිටින ආයතන අතර අන්තර්ක්‍රියාවක් පැවතීම
- සමජාතීය හෝ ප්‍රබේදිත භාණ්ඩයක් ඉදිරිපත් කිරීම
- ආයතනය පහළට බෑවුම් වන සාපේක්ෂ අනම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දීම

**1.19** මූල්‍ය අතරමැදි ආයතන දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- සමූපකාර සමිති
- රක්ෂණ සමාගම්
- කල්බදු සමාගම්
- ඒකක භාර ආයෝජන සමාගම්
- සේවක අර්ථසාධක අරමුදල

**1.20** තිරසාර සංවර්ධනයේ සමාජ පැතිකඩ දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- සහයෝගීතාවය
- සමානාත්මතාවය
- සමාජ සහජීවනය
- සවිබලගැන්වීම
- සංස්කෘතික අඛණ්ඩතාවය
- සමාජ සංචලනය

***(එක් කොටසකට ලකුණු 02, මුළු ලකුණු 40 යි)***

***A කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 40 යි)

**B කොටස**

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය 01 - ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති*

**(a)** ආර්ථික භාණ්ඩයක ලක්ෂණ දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- සැපයුම සීමිත වීම/හිඟකමක් පැවතීම
- සම්පත් පිරිවැයක් පැවතීම
- ආවස්ථික පිරිවැයක් පැවතීම
- බොහෝ ආර්ථික භාණ්ඩ වලට මිලක් පැවතීම
- නිෂ්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස ආර්ථික භාණ්ඩ බිහි වීම
- පැහැදිලි හිමිකාරීත්වයක් පැවතීම

*(ලකුණු 03)*

**(b)**

**කුමක් නිපදවන්නේ ද?**

මිශ්‍ර ආර්ථික පද්ධතියක පෞද්ගලික අංශය ඉහළ මිලකට අලෙවි කල හැකි, ඉහළ ලාභයක් ඉපයිය හැකි භාණ්ඩ නිෂ්පාදනය කරයි. කෙසේ වෙතත් රාජ්‍ය අංශය සමාජ සුභසාධනය අරමුණු කරගෙන භාණ්ඩ නිපදවයි.

**කෙසේ නිපදවන්නේ ද?**

මිශ්‍ර ආර්ථික පද්ධතියක පෞද්ගලික අංශය ලාභ උපරිම කර ගැනීමේ අරමුණ සහිතව පිරිවැය අවම වන ශිල්ප ක්‍රමය තොරා ගන්නා අතර රාජ්‍ය අංශය සමාජ සුභසාධන සහ සාධාරණත්වය උපරිම වන ශිල්ප ක්‍රමය තොරා ගනී.

**කා සඳහා නිපදවන්නේ ද?**

මිශ්‍ර ආර්ථික පද්ධතියක පෞද්ගලික අංශයේ ක්‍රය ශක්තිය මත මෙම ප්‍රශ්නය විසඳා ගන්නා අතරම රාජ්‍ය අංශය සමාජ අවශ්‍යතාවන් මත මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයයි.

*(ලකුණු 05)*

**(c)** එක් හේතුවක් පමණක් බලාපොරොත්තු වේ.

සලකා බලන භාණ්ඩයේ මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් ඇති වීමට හේතු පහත පරිදි වේ,

(1) මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය
(2) මිල වෙනස් වීමක ආදායම් ප්‍රතිවිපාකය

aat SRI LANKA

**මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය**

සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම කෙරෙහි බලපාන ආදේශන භාණ්ඩවල මිල ද ඇතුළුව අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස්වීම හේතු කොටගෙන එහි සාපේක්ෂ මිල වෙනස් වීම නිසා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම, මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය ලෙස හැඳින්වේ.

**මිල වෙනස් වීමක ආදායම් ප්‍රතිවිපාකය**

සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම කෙරෙහි බලපාන ගැනුම්කරුවන්ගේ නාමික මුදල් ආදායම ඇතුළු අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වීම හේතු කොටගෙන ගැණුම්කරුවන්ගේ මිලදී ගැනීමේ හැකියාවේ (මූර්ත ආදායමේ) ඇති වන වෙනස් වීම් මත සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම ආදායම් ප්‍රතිවිපාකය ලෙස සලකයි.

*(ලකුණු 02)*
*(මුළු ලකුණු 10 යි)*

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

*පරිච්ඡේදය 02 - ඉල්ලුම, සැපයුම, සමතුලිතය හා රජය මැදිහත් වන ආකාරය*

**(a)**

$$Qd = 1200 - 20p$$
$$Qs = -200 + 20p$$

$$Qd = Qs$$
$$1200 - 20\,p = -200 + 20\,p$$
$$-20p - 20p = -200 - 1200$$

$$\frac{-40p}{-40} = \frac{-1400}{-40}$$

$$p = \text{රු}.\ 35$$

ඉල්ලුම් සමීකරණයේ මිලට රු. 25 ආදේශ කිරීමෙන්

$$Qd = 1200 - 20p$$
$$Qd = 1200 - 20\ X\ 35$$
$$Qd = 1200 - 700$$

ඒකක 500

*(ලකුණු 03)*

**(b)** සාධක තුනක් පමණක් බලාපොරොත්තු වේ.

- අදාළ භාණ්ඩය අත්‍යාවශ්‍ය භාණ්ඩයක් ද සුඛෝපභෝගී භාණ්ඩයක් ද යන්න.
- භාණ්ඩ සඳහා පවතින ආදේශක වල සුලභත්වය සහ ආදේශක වල සමීපතාවය
- අදාළ භාණ්ඩය වෙනුවෙන් ආදායමෙන් වැය කරනු ලබන ප්‍රතිශතය
- අදාළ භාණ්ඩයෙන් ඇති විකල්ප ප්‍රයෝජන සංඛ්‍යාව
- මිල වෙනස්වීමෙන් පසු ඒ සඳහා අනුගතගත වීමට අවශ්‍ය වන කාලය


*(ලකුණු 03)*



aat SRI LANKA

**(c)**

පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන නිමැවුම් මට්ටම, වෙළඳපොළ තීරණය වූ මිල යටතේ නිෂ්පාදන කර අලෙවි කිරීමෙන් ලාභ උපරිම කර ගනී. එහිදී වෙළඳපොළ තීරණය වූ මිල සාමාන්‍ය මුලු පිරිවැයට වඩා වැඩි නම් ආයතනය ආර්ථික ලාභ උපයයි. තවද මිල සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩු නම් ආයතනය වසා දැමීමට කටයුතු කරයි. මේ ආකාරයට ලාභ උපරිම කර ගන්නා ප්‍රමාණය තීරණය කරන ආකාරය පහත රූප සටහන මඟින් නිරූපණය කරයි.




*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10 යි)*

SRI LANKA

## හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

***පරිච්ඡේදය 05 - මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම***

**(a)** චේතනාවන් දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- ගනුදෙනු චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ චේතනාව

*(ලකුණු 02)*

**(b)** වාණිජ බැංකුවකට එහි ප්‍රධාන අරමුණු දෙක වන ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය අතර තුලනයක් පවත්වා ගැනීමට සිදුවේ.

**ද්‍රවශීලතා අරමුණ** - මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා සැම අවස්ථාවක ම වාණිජ බැංකුවලට ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් පැවතිය යුතු බවයි. කෙසේ වෙතත් ද්‍රවශීල වත්කම් බොහෝ විට පහළ මට්ටමක ප්‍රතිලාභ ලබා දෙන බැවින් ලාභදායීත්වය පිලිබඳ ගැටලු ඇති විය හැකිය.

**ලාභදායීත්ව අරමුණ** - වාණිජ බැංකු ණයක් ලබා දීමෙන් සහ දිගු කාලීන වත්කම් වල ආයෝජනය කිරීම මගින් ලාභයක් උපයා ගත යුතු බවයි. මෙමගින් ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකි වුවත් ද්‍රවශීලතා ගැටලු ඇති විය හැකිය.

*(ලකුණු 04)*

**(c)** ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- **ණය පිළිබඳ උපරිම කල් පිරීමේ කාල සීමා නියම කිරීම**

ණය පිළිබඳ උපරිම කල් පිරීමේ කාල සීමාව අඩු කිරීම මඟින් ආර්ථිකයට ගලා යන ණය ප්‍රමාණය අඩු වන අතර උපරිම කල් පිරීමේ කාල සීමාව ඉහළ නැංවීම මඟින් ආර්ථිකයට ගලා යන ණය ප්‍රමාණය වැඩි වේ. ඒ අනුව ආර්ථිකයේ කිසියම් ක්ෂේත්‍රයක් දිරි ගැන්වීමට අවශ්‍ය නම් එම ක්ෂේත්‍රයට ලබා දෙන ණය වල උපරිම කල් පිරීමේ කාල සීමාව ඉහළ නැංවීම කල යුතුය.

- **වරණාත්මක පොළී අනුපාතයක් නියම කිරීම**

ආර්ථිකයේ කිසියම් ක්ෂේත්‍රයක් සඳහා ලබා දෙන ණය ප්‍රමාණය සීමා කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ වන ණය පොළී අනුපාතය ඉහළ නැංවිය යුතු අතර කිසියම් ක්ෂේත්‍රයක් සඳහා ලබා දෙන ණය ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ වන ණය පොළී අනුපාතය පහත හෙළිය යුතුය.

- **ඇප සුරැකුම් සඳහා සීමා පැනවීම**

ආර්ථිකයේ කිසියම් ක්ෂේත්‍රයක් සඳහා ලබා දෙන ණය ප්‍රමාණය සීමා කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ වන ඇප සුරැකුම් ප්‍රමාණය ඉහළ නැංවිය යුතු අතර කිසියම් ක්ෂේත්‍රයක් සඳහා ලබා දෙන ණය ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ වන ඇප සුරැකුම් ප්‍රමාණය ලිහිල් කල යුතුය.

SRI LANKA

- **ණය පිළිබඳ උපරිම සීමා නියම කිරීම**

ආර්ථිකයේ කිසියම් ක්ෂේත්‍රයක් සඳහා ලබා දෙන ණය ප්‍රමාණය පිළිබඳ සීමාවන් පැනවීමයි. මෙම සීමාවන් ඉහළ නැංවීම මඟින් එම ක්ෂේත්‍රයක් සඳහා ගලා යන ණය ප්‍රමාණය පහල යයි.

- **අනෙකුත්**

ණයවර ලිපි සඳහා කාසි ආන්තික නිකුත් කිරීම, යහ පෙළඹවීම් වැනි වක්‍ර පාලනයන් මඟින් ද ණය පිළිබඳ පරිචයන් සහ මූල්‍ය ස්ථාවරත්වය සඳහා බලපෑම් කල හැකිය.

*(ලකුණු 04)*
*(මුළු ලකුණු 10 යි)*

## පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 06 - අන්තර්ජාතික වෙළෙඳාම සහ විදේශ විනිමය වෙළඳපොළ**

**(a)** උපකල්පන දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- පූර්ණ සාධක සංචලතාවය
- ස්ථාවර පරිමාණානුකූල ඵල පවතින බව
- ප්‍රවාහන පිරිවැය ශූන්‍ය බව
- නිෂ්පාදනය හෝ පරිභෝජනය හෝ ආශ්‍රයෙන් බාහිරතා නොමැති බව

*(ලකුණු 02)*

**(b)**

**(i)** **A** රටට **Q** භාණ්ඩය නිෂ්පාදන කිරීමේ නිරපේක්ෂ වාසි පවතී

**B** රටට **P** භාණ්ඩය නිෂ්පාදන කිරීමේ නිරපේක්ෂ වාසි පවතී

*(ලකුණු 02)*

**(ii)**

| | **P භාණ්ඩ ඒකක** | **Q භාණ්ඩ ඒකක** |
|---|---|---|
| **A** රට | 4 | 12 |
| **B** රට | 21 | 7 |

සාපේක්ෂ වාසි ගණනය කිරීම සඳහා එක් එක් භාණ්ඩ ඒකකයේ ආවස්ථික පිරිවැය ගණනය කල යුතුය.

| රට | **P භාණ්ඩ ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය** | **Q භාණ්ඩ ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය** |
|---|---|---|
| A රට | 12/4 = 3 | 4/12 = 0.33 |
| B රට | 7/21 = 0.33 | 21/7 = 3 |

ඉහත වගුවට අනුව A රට Q භාණ්ඩ ඒකකයක් අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවන අතර B රට P භාණ්ඩ ඒකකයක් අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවයි. ඒ අනුව,

- A රටට Q භාණ්ඩ ඒකකයක් නිපදවීමේ සාපේක්ෂ වාසි පවතී. (0.33< 3)
- B රටට P භාණ්ඩ ඒකකයක් නිපදවීමේ සාපේක්ෂ වාසි පවතී. (0.33< 3)

*(ලකුණු 04)*

**(c)** පියවර දෙකක් පමණක් බලාපොරොත්තු වේ.

- අපනයනවල තරඟකාරීත්වය ඉහළ නැංවීම
- අපනයන වියදම අඩු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- බාහිර අසමතුලිතතාවය අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා අතරතුර අභ්‍යන්තර අසමතුලිතතා අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- මූල්‍ය ප්‍රතිපත්තිය මැදිහත්වීම් වලින් තොරව නිදහසේ ක්‍රියාත්මක කිරීමට ඉඩ දීම

***(ලකුණු 02)***


***(මුළු ලකුණු 10 යි)***

***B කොටසෙහි අවසානය***

## *හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 04 - ජාතික ගිණුම්කරණය සහ රජයේ කාර්යභාරය***

**(A) (a)**




SRI LANKA

ව්‍යාපාර චක්‍රයේ ප්‍රධාන අදියරයන් 4කි

- **මුදුනත** - විභව නිමැවුමට ඉහළ සැබෑ නිමැවුමේ ඉහළ ම අවස්ථාව මුදුනත වේ. ආර්ථික ප්‍රසාරණය අවසාන වී ආර්ථික පසුබැසීම මෙම ලක්ෂ්‍යයේදී ආරම්භ වේ.

- **පසු බැසීමේ අවධිය** - මුදුනත සිට පතුල දක්වා ගමන් කරන අවධිය නිමැවුමේ පසු බැසීමේ අවධිය වේ. මෙහිදී නිෂ්පාදනය හා සේවා නියුක්තිය අඩු වේ.

- **පතුල** - විභව නිමැවුමට පහළ සත්‍ය නිමැවුමේ පහළ ම අවස්ථාව පතුල වේ. ආර්ථික පසු බැසීම අවසාන වී ආර්ථික ප්‍රසාරණය මෙම ලක්ෂ්‍යයේදී ආරම්භ වේ.

- **ප්‍රසාරණ අවධිය** - පතුලේ සිට මුදුනත දක්වා ගමන් කරන අවධිය නිමැවුමේ ප්‍රසාරණ අවධිය වේ. ***(ලකුණු 03)***

**(B) (i)**

| | අයිතමය | | රු. මිලියන |
|---|---|---|---|
| 1. | පෞද්ගලික පරිභෝජන වියදම | = | 1,600 |
| 2. | රාජ්‍ය පරිභෝජන වියදම | = | 2,500 |
| 3. | දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | = | 9,550 |
| | 3.1 දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 4,500 | | |
| | 3.2 තොග වෙනස් වීම 2,500 | | |
| | 3.3 වටිනා දෑ වෙනස් වීම 2,550 | | |
| | **වෙළඳ මිලට දළ දේශීය වියදම 1 + 2 + 3** | = | **13,650** |

*(ලකුණු 06)*

**(ii)**

| | අයිතමය | | රු. මිලියන |
|---|---|---|---|
| 1. | වෙළඳ මිලට දළ දේශීය වියදම | = | 13,650 |
| 2. | එකතු කලා : භාණ්ඩ හා සේවා අපනයන | = | 4,800 |
| | අඩු කලා : භාණ්ඩ හා සේවා ආනයන | = | (2,750) |
| | වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය | = | 15,700 |

*(ලකුණු 03)*

**(iii)**

| | අයිතමය | | රු. මිලියන |
|---|---|---|---|
| 1. | වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය | = | 15,700 |
| 2. | විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | = | 1,004 |
| | වෙළඳ මිලට දළ ජාතික ආදායම | = | 16,704 |

*(ලකුණු 02)*

**(c)** දළ දේශීය ආදායම සහ දළ ජාතික ආදායම අතර වෙනස විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම වේ.

දළ ජාතික ආදායම = දළ දේශීය ආදායම + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම

ආර්ථිකයක සියලුම ප්‍රාථමික ආදායම් වල එකතුව දළ දේශීය ආදායම ලෙස හඳුනා ගැනේ. ආර්ථිකයක් තුළ භාණ්ඩ හා සේවාවන් නිෂ්පාදනය කිරීමෙන් උපයා ගත් සාධක ආදායම සහ නේවාසිකයන් තමන් සතු නිෂ්පාදන සාධක විදේශයන්හි ආයෝජනය කිරීමෙන් උපයා ගත් සාධක ආදායමත් අනේවාසිකයින් සතු නිෂ්පාදන සාධක ආර්ථික ප්‍රදේශය තුළ ආයෝජනය කිරීම වෙනුවෙන් ගෙවූ සාධක ආදායම් අතර වෙනස දළ ජාතික ආදායම ගණනය කිරීමේදී සැලකිල්ලට ගනී.

*(ලකුණු 03)*

aat SRI LANKA

**(d)**

රජයේ වියදම් වලට අදාළව ව්‍යාපාර වලට ආයෝජන අවස්ථා නිර්මාණය වනු දැකිය හැකිය. මෙය සාමාන්‍යයෙන් දැකිය හැකි වන්නේ රජය ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් බදු පහළ මට්ටමක පවත්වා ගනිමින් රජය විසින් සහ අනෙකුත් මූලාශ්‍ර මගින් ආර්ථිකයට අලුතෙන් මුදල් එකතු කරන අවස්ථාවන්හිදීය.

අනෙක් අතට රජය සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් බදු ඉහළ නංවමින් සහ රජයේ වියදම් කපා හරිමින් කටයුතු කරන විටෙක එය ව්‍යාපාර වල ලාභය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.

රාජ්‍ය වියදම් පියවා ගැනීමට බදු ආදායම ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදී රජයට එම හිඟය පියවා ගැනිම සඳහා ණය ලබා ගැනීමට සිදුවේ. එමගින් ආර්ථිකයේ පොළී අනුපාත ඉහළ යාමට පීඩනයක් ඇති කරයි. මෙලෙස ආර්ථිකයේ පොළී අනුපාත ඉහළ යාම නිසා පෞද්ගලික අංශයේ ආයෝජන අධෛර්යමත් වේ. මෙය තෙරපුම් ප්‍රතිවිපාකය ලෙස හැඳින්වේ.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළ රජය විසින් ව්‍යාපාර මත විවිධ බදු පනවයි. රාජ්‍ය රාජ්‍ය වියදම් ඉහළ යාම තුළ එම වියදම් පියවා ගැනීම වෙනුවෙන් ණය ලබා ගන්නා අතර එම ණය සහ පොළී ගෙවීම් වෙනුවෙන් රජයට බදු වැඩි කිරීමට සිදුවන අතර එය ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරයි.

*(ලකුණු 03)*

*(මුළු ලකුණු 20 යි)*

aat SRI LANKA

***C* කොටසෙහි අවසානය**

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*